ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

## පුවත්පත් නිවේදනය

### ශ්‍රී ලංකා - ඉන්දියා සමාජයේ වාර්ෂික මහ සභාව කොළඹදී

ශ්‍රී ලංකා - ඉන්දියා සමාජයේ (Sri Lanka India Society – SLIS) වාර්ෂික මහ සභාව 2019 සැප්තැම්බර් 30 වන දින කොළඹදී පැවැත්විණ. ශ්‍රී ලංකා - ඉන්දියා සමාජයේ අනුශාසක ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගරු තරංජිත් සිං සන්ධු මැතිතුමා මෙහි ප් රධාන අමුත්තා ලෙස සහභාගී විය.

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව නිදහස ලබා කෙටි කලකින් එනම් 1949 වර්ෂයේදී පිහිටුවන ලද ශ්‍රී ලංකා - ඉන්දියා සමාජය ශ්‍රී ලංකාවේ පැරණිතම සහ විශාලතම මිත්‍රත්ව සමාජය වේ.

මෙම අවස්ථාවේදී, ප්‍රධාන දේශනය පවත්වමින් මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කළේ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින සම්බන්ධතා මෑත කාලයේදී විශාල වශයෙන් සුබවාදී ලෙස වර්ධනය වී ඇති බවයි. මාලදිවයිනේ පැවති ඉන්දීය සාගර සමුළුවට සමගාමීව ඉන්දීය විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය එස්. ජයිශංකර් සහ ශ් රී ලංකා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා අතර හමුව පිළිබඳව මෙහිදී මහ කොමසාරිස්තුමා සිහිපත් කළේය. ශ්‍රී ලංකාව නිව් යෝක් නගරයේදී, ආරම්භක සාමාජිකයකු වශයෙන් ආපදා පුනරුත්ථාපන

යටිතල පහසුකම් සඳහා වන එකතුවට (Coalition for Disaster Resilient Infrastructure - CDRI) එක් විය. CDRI යනු ආපදා පුනරුත්ථාපනය ඉහළ නැංවීම සඳහා සමාන අදහස් වලින් සමන්විත රටවල්වල එකතුවෙන් ඉන්දියාව විසින් ස්ථාපනය කරන ලද සංවිධානයකි.

ඉන්දියාවේ නිෂ්පාදිත, නව දුම්රිය දෙකක් සහනදායි ණය ආධාර යටතේ බෙලිඅත්ත සහ පොළොන්නරුව දක්වා ධාවනය කිරීම සඳහා ලබා දීම ඇතුළු මෑත කාලීන වර්ධනයන් මගින් දෙරට අතර සංවර්ධන සහයෝගීතාවය ඉහළ මට්ටමකට ළඟා වී ඇති බව මහ කොමසාරිස්තුමා ප්‍රකාශ කළේය. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට සම්පූර්ණයෙන්ම වායු සමීකරණය කළ දුම්රිය දෙකක් සැපයීම සඳහා නව ගිවිසුමක් අත්සන් කර තිබේ. රටම කම්පනයට පත් කළ පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් අනතුරුව ඉන්දියානු සංචාරකයින් නැවතත් විශාල වශයෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන බවද එතුමා සඳහන් කළේය. ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රමුඛතාවයන් මත පදනම්ව එහි සංවර්ධනයට සහයෝගය ලබා දීමට ඉන්දියාව සූදානම් බව එතුමා අවධාරණය කළේය.

ශ්‍රී ලංකා - ඉන්දියා සමාජයේ හිටපු සභාපති ටී. එස්. ප්‍රකාශ් මහතා සමාජයේ ක්‍රියාකාරකම් ඉහළ නැංවීමට දැක්වූ දායකත්වය අගය කළ මහ කොමසාරිස්තුමා නව සභාපති රොහාන් තුඩාවේ මහතාටද නව විධායක කමිටුවටද සිය ශුභාසිංසන එක් කළේය.

Colombo

1 October, 2019